## පුංචි අක්කගෙන් සඳාදර නැගණියට සුවඳ පිනි පොදක්වන් උපන්දින සුබ පැතුම්

දෙදහස් විසිදෙකේ
නවම් මස විසි හයේ
සැත්තෑපස් වසක්
දිවිමග ගෙවාගෙන
ළඟා වූ විරාමය
ඔබෙ සිතට සතුටක්
මහදට ද සතුටක්
ලබාදුනි අද දින
ප්‍රියාදර නැගණියනි!

* *

මේ සසර නවාතැනෙ
සොයුරියන් සේ එක්ව
ගෙවා යන දිවි මග
ගලා යන සෙනෙහෙ ගඟ
නේක දුක් දොම්නසින්
නේක සැප සම්පතින්
බැඳුනු රන් දමක් සේ
අප දෙදෙන වෙලී ඇත

* *

අට ලෝ දහම සේ
දිවි මං තලාවේ
අප රඟන නරිනාටක
නිමාවෙයි නුදුරේම
අපට නොදැනෙන සේ
සසර වසනා තුරා
ඔබ මගේ නැගණියම
වේවා! යි පතමි මම

* *

බාල වියේ සිට
සෙනෙහසින් තුරුලට ගත්
කෙළිදෙලෙන් ගත කළ
සොඳුරුතම අතීතය
සිහි වෙයි මා හට

* *

මගෙ එකම නැගණිය
ඔබම විය මා හට
සොයුරු සොයුරියන් වූ
අප සය දෙනාගෙම
බඩ පිස්සී ඔබයි
සැමගෙ සෙනෙහස ලැබූ
සොඳුරු නැගණිය ඔබයි

* *

මගේ පිළිසරනට
අත්වැලක් වී වරෙක
වරින්වර මා ළඟ සිටි
ගෙවී ගිය තුරුණු විය
මතකයට එයි හැමවිට

* *

*   *

මට වඩා සත් වියක්
බාල වූ ඔබ එදා
තිඹිරි ගෙයි නැගූ හඬ
මවගෙ කෙඳිරිලි මැදින්
බාල දෙසොයුරන් හා
කන් දෙමින් එබෙමින්
සිටි අයුරු සිහිවෙයි
“ඔයාලට ඔන්න තව
නංගියෙක් නංගියෙක්”
කවුදෝ කියූ හඬ
අසා අප නටාගෙන
දිව ගිය ඒ දිනය
නවසිය හතලිස් හතේ
බව සිහි වෙයි
සොම්නසින් පිනාගිය
අප දුටු ඒ දසුන
සිහිති කුමරිය ඔබයි
ඔබ අපේ නැගණියයි

*   *

එදා සිට මෙදාතුර
ඔබ මගේ නැගණියයි
සදාදර සෙනෙහසින්
මා තැනූ නැගණියයි
රැවුම් ගෙරවුම් මැදින්
දඟකාරකම් මැදින්
ගෙවීගිය ඒ යුගය
කෙළි දෙලෙන් නිමාවිය

*   *

*   *

බාල වැඩිමල් ලෙසින්
අක්කලා අයියා
මල්ලිලා නංගී
සැම දෙනට මැදි වූ
මගේ සුමිහිරි දිවිය
පිරිපුන් එකක් වී

*   *

අප සැමට ජීවිතයෙ
විඳින්නට සතුටින්
ජීවන තක්සලාවේ
මහිමය කියාදුන්
ගුණ දහම් පිරිපුන්
දිවිමග කියාදුන්
සදාදර මෑණියන්
සදාදර පියාණන්
සුරලොවට ළඟාවී
දිව නෙතින් අප දෙස
බලන බව මට සිතේ

*   *

*  *

තමන් සතු සියළු දේ
යස ඉසුරු ගේදොර
වතුපිටි සියළු දේ
තමා තැනූ දරුවන්ට
අප සත් දෙනාටම
නොමසුරුව ලබා දී
අප සැමගෙ දිවියට
සවියක් වූ ඔවුන්
අප මිය යන තුරා
සවියක් වූ ඔවුන්
සුවඳ විහිදුවමින්
පිපෙන සියපත් ලෙසින්
අපේ හදවත් තුල
ලැගුම් ගෙන මතකයන්
දිවනෙතින් බලාගෙන
සිටිනසැටි මට පෙනේ

*  *

අදප අප දෙදෙනාම
දිවි මගේ සැඳෑවට
පා නගා නගන හඬ
මිණි කිකිණි සිනා හඬ
දුක සැප සමබරව
සැහැල්ලුව සිත දරා
වරින් වර මා හදට
සැනසුමක් ලබා දෙයි
ඔබ මගේ නැගණියයි
මා ලැබූ සම්පතයි

*  *

*  *

තෙරුවන් සරණ ලැබ
සියළු දෙවි රැකවරණින්
නිදුක් වී, නිරෝගිව
සොම්නසින් උදම් වී
දොම්නසින් නොසෙල්වී
මේ සසර ගමන යමු
සදාදර සෙනෙහසින්
ඔබ මගේ නැගණියයි
මා ඔබේ සදාදර
පුංචි අක්කා තමයි
ඔබ එකම නැගණියයි

*  *

2022-03-18 පබැඳුම
කල්‍යාණී සෙනරත් යාපා